# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/33 - 2024 සැප්තැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

### නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ඇ ව්‍යවස්ථාව යටතේ නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර එම්. සෙන්තිල් තොණ්ඩමාන් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024.09.12 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් 1 හා 2 යටතේ දක්වා ඇති පරිදි නැගෙනහිර පළාත් පාසල් පිළිබඳ කටයුතු කළයුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. පළාත් පාසල්වල භෞතික සම්පත් ලබා දීමෙන් සංවර්ධන කටයුතු සිදු කිරීමටත් රාජ්‍ය නොවන ආයතන ජාත්‍යන්තර රාජ්‍ය නොවන ආයතන හා අනුග්‍රහකයින් සහභාගි කිරීමේ ක්‍රමවේදය පහත සඳහන් වේ.

    1.1. උපකරණ බෙදා දීම - උපකරණ වර්ග, ප්‍රමාණය, ප්‍රතිලාභීන්ගේ සියළු විස්තර, බෙදාහැරීමේ ක්‍රමවේදය, ක්‍රියාවේ අරමුණ සහ ඉල්ලීම් සහ නිර්දේශ.

    1.2. භෞතික සම්පත් සැපයීම (ගොඩනැගිලි හා ඉදිකිරීම්) - ඉදිකිරීමේ අරමුණ, ප්‍රතිලාභීන්ගේ විස්තර, ගොඩනැගිලි සැලැස්ම සහ දළ සටහන, ඉදිකිරීම සිදුවන ස්ථානය, ඉදිකිරීමට යෝජිත ව්‍යාපෘති ඇගයීම, ඉල්ලීම්, අවශ්‍ය නිර්දේශ හා මුල්ගලෙහි ආකෘතිය ආදිය මෙහි ඇතුලත් වේ.

මෙම කටයුතු වලට පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු අතර ඒ සඳහා ඉහත සඳහන් ලේඛන ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. වැඩසටහන් හා උත්සව සංවිධානය කිරීම හා කළමනාකරණය කිරීමේ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වේ.

2. පළාත් පාසල් වල තූර්ය වාදක කණ්ඩායම් එම පාසල්වල උත්සව අවස්ථාවලට පමණක් භාවිතා කළ යුතු අතර, එම තූර්ය වාදක කණ්ඩායම් බාහිර උත්සව අවස්ථා සඳහා භාවිතා කිරීමේදී වැඩසටහන් සංවිධායකවරු විසින් අදාළ පාසලේ විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. එම කණ්ඩායම් සඳහා ආහාර, ජල පහසුකම් හා සුදුසු නවාතැන් පහසුකම් ඇතුළු අවශ්‍ය සියලු පහසුකම් සහ රැකවරණය සංවිධායකවරුන් විසින් ලබා දිය යුතුය.

අධ්‍යාපන නොවන වැඩසටහන්/දේශපාලන පක්ෂ ප්‍රවර්ධන වැඩසටහන් හා දුරබැහැර ප්‍රදේශ සඳහා බස්රථ මඟින් ගමන් කිරීමට සිදුවන වැඩසටහන් ආදිය සඳහා මෙම තූර්ය වාදක කණ්ඩායම් යොදා ගැනීම සපුරා තහනම්ය.

**එම්. සෙන්තිල් තොණ්ඩමාන්,**
නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර.

EOG 09 - 0112

1A - PG 6872 — 29 (2024/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*